වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

# ක්‍රීඩා පිට්ටනිය කුලියට ලබා ගැනීමේ සඳහා වූ ඉල්ලුම් පත්‍රය

(ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර ක්‍රීඩා පිට්ටනිය කුලියට දීමේ කොන්දේසි හොඳින් කියවා අවබෝධ කර ගන්න)

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම : ........................................................................................
2. හැඳුනුම්පත් අංකය : ........................................(පරීක්ෂා කිරීම සඳහා මුල් පිටපත අවශ්‍ය වේ)
3. ජංගම දුරකතන අංකය : ........................................................................................
4. ඊ - මේල් ලිපිනය : ........................................................................................
5. තැපැල් ලිපිනය : ........................................................................................
6. ක්‍රීඩා පිටියේ නම : ........................................................................................
7. ක්‍රීඩා පිට්ටනිය යොදා ගන්නා කාර්යය : ක්‍රීඩා උත්සවයක්* / ක්‍රීඩා තරඟ පැවැත්වීමක්* / සංගීත සංදර්ශනයක්* / සැණකෙළියක්* / මහජන රැස්වීමක්* / වෙනත් (................................................)*
8. අවශ්‍ය කරන දිනය / දින : ........................................................................................
9. අවශ්‍ය වේලාව (වෙන් කරන දින ගණන අනුව) : ..........................................................................
10. කාර්යයේ පූර්ව සූදානම් වීම සඳහා කලින් දිනය වෙන් කිරීම අවශ්‍ය වන්නේද? : ඔව් / නැත
11. එසේ නම් අවශ්‍ය වේලාව : ........................................................................................

ක්‍රීඩා පිට්ටනිය කුලියට දීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව නියම කර ඇති නියම හා කොන්දේසි සමඟ එකඟ වෙමි. කරුණාකර ක්‍රීඩා පිට්ටනිය මා වෙනුවෙන් වෙන් කර දෙන්න. මා විසින් කුලියට ලබා ගන්නා ක්‍රීඩා පිට්ටනිය නියමිත වේලාවට ආපසු භාරදිය නොහැකි වුවහොත් ඒ ප්‍රමාදය සඳහා වන ගාස්තුව සහ / හෝ ක්‍රීඩා පිට්ටනියට හෝ එහි කිසියම් සවි කිරීමකට හෝ එහි කිසියම් කොටසකට හෝ කිසියම් ගෘහ භාණ්ඩයකට හෝ සිදු වන හානියක් හෝ අලාභයක් මා විසින් සභාවේ තැන්පත් කරනු ලබන ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදලින් අඩු කර ගැනීමට මාගේ කැමැත්ත මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. සිදු වී ඇති හානිය හෝ අලාභය පියවා ගැනීමට තැන්පත් මුදල ප්‍රමාණවත් නොවන්නේ නම්, තවදුරටත් ගෙවිය යුතු හානි හෝ අලාභ ප්‍රතිපූර්ණ මුදල, මා විසින් ගෙවීමට මා බැඳී සිටින බව මා දන්නා බවත් එසේ ගෙවනු ලබන බවත් ප්‍රකාශ කර සිටිමි.

දිනය :..............................

.....................................

ඉල්ලුම්කරුගේ අත්සන

**කාර්යාල ප්‍රයෝජනය සඳහා**

ක්‍රීඩා පිට්ටනිය භාර නිලධාරී,

- ඉල්ලීම සම්පූර්ණ කිරීමට හැකිය. ඒ අනුව පහත සඳහන් ගාස්තු අය කරගත හැක.
- කලින් කරනු ලැබූ ඉල්ලීම් හේතුවෙන්, ඉල්ලා ඇති දිනයට කලින් දින වෙන් කිරීම කළ නොහැක. ඉල්ලුම්කරුට ඒ බව වාචිකව දන්වන ලදී. ඒ අනුව කලින් දින වෙන් කිරීමකින් තොරව ක්‍රීඩා පිට්ටනිය වෙන් කර ගැනීමට ඉල්ලුම්කරු කැමැත්ත පළ කරන ලදී. ඒ අනුව පහත සඳහන් ගාස්තු අය කරගෙන ඇත.
- කලින් කරනු ලැබ ඇති ඉල්ලීම් හේතුවෙන්, අවශ්‍යතාව සම්පූර්ණ කළ නොහැක. ඉල්ලුම්කරු ඒ පිළිබඳව දැනුවත් කර ඇත. ඒ බව ඉල්ලුම්කරු වාචිකව දැනුවත් කරන ලදී.
- ........................................................................................................................................
........................................................................................................................................
..................................................................................................................................

| **කාර්යය** | **මුදල** |
|---|---|
| (අ) ක්‍රීඩා පිට්ටනිය වෙන් කිරීමේ ගාස්තු (දින ......... x .........) | රු........................... |
| (ආ) පූර්ව සූදානම සඳහා වෙන් කිරීමේ ගාස්තු (පැය......... x .........) | රු........................... |
| (ඇ) ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල | රු........................... |
| මුළු අය කිරීම | රු........................... |

දිනය : 20...............................

....................................

ක්‍රීඩා පිට්ටනිය භාර නිලධාරී

---

පෙරටු කාර්යාල නිලධාරී / විෂය භාර නිලධාරී,

වෙන් කිරීම අනුමතයි. ක්‍රීඩා පිට්ටනිය භාර නිලධරයා දැනුවත් කිරීමට ක්‍රියා කරන්න.

දිනය : 20...............................

....................................

සභාපති / ලේකම්

---

සභාපති / ලේකම්,

1. කාර්යය අවසානයේ ක්‍රීඩා පිට්ටනිය නිදහස් කර භාර දී ඇත. පහත සඳහන් පරිදි අය කර ගත යුතු වන අලාභ සිදු වී ඇති බව වාර්තා කරමි.

| විස්තරය | මුදල | මුදල |
|---|---|---|
| (අ) ඉල්ලුම්කරු සභාවට ගෙවා ඇති තැන්පත් මුදල | | රු.......................... |
| (ආ) අලාභ හානි වෙනුවෙන් සහ ප්‍රමාදය වෙනුවෙන් අය කළ යුතු මුදල: | | |
| i. සිදු වී ඇති අලාභය | | |
| * අලාභය 1 - ........................................................................... | | රු.......................... |
| *අලාභය 2 - ........................................................................... | | රු.......................... |
| * අලාභය 3 -........................................................................... | | රු.......................... |
| * අලාභය 4 - ........................................................................... | | රු.......................... |
| ii. ආපසු භාර දීමට සිදු වූ ප්‍රමාදයට (පැය.........) ගාස්තු | | රු.......................... |
| iii. ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) | | රු.......................... |
| iv. එකතු කළ අගය මත බද්ද (VAT) | | රු.......................... + |

(ඇ) අය කර ගත යුතු මුළු මුදල රු............

(ඈ) තැන්පතුවෙන් ගෙවිය හැකි ඉතිරි / තව දුරටත් අය කර ගත යුතු මුදල

රු............

2. ඉහත ගණන් බැලීම අනුව පහත පරිදි ඉදිරි කටයුතු කිරීම නිර්දේශ කරමි.

- ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල ඉල්ලා සිටීමෙන් පසු නිදහස් කිරීම.
- අලාභ වෙනුවෙන් අය කර ගත යුතු රු............................... ක මුදල අය කර ගෙන ඉතිරිය ඉල්ලා සිටීමෙන් පසු ආපසු ගෙවීම.
- ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල, අලාභ පියවා ගැනීමට ප්‍රමාණවත් නොවන බැවින් තව දුරටත් අය කර ගත යුතු මුදල ඉල්ලා ඉදිරි කටයුතු කිරිමට ගිණුම් අංශයට යොමු කිරීම.

3. ඉහත ගණන් බලන ලද පරිදි අය කිරීම් කිරීම සඳහා / කාර්යය අවසානයේ ක්‍රීඩා පිට්ටනිය පාඩුහානි කිසිවක් නැතිව නිදහස් කර භාර දී ඇත.

දිනය : 20..............................  ...................................

පෙරටු කාර්යාල නිලධාරී / විෂය භාර නිලධාරී

---

පෙරටු කාර්යාල නිලධාරී / විෂය භාර නිලධාරී,

ඉහත නිර්දේශය අනුමත කරමි. එහි නිර්දේශිත ආකාරයෙන් කටයුතු කරන්න.

දිනය : 20..............................  ...................................

සභාපති / ලේකම්

ගිණුම් විෂය භාර නිලධරයා,

ඉහත සභාපතිගේ / ලේකම්ගේ නියෝගය පරිදි,

- 20................................ දින නිකුත් කළ ඉහත සඳහන් අංක ........................................... දරන ලද පතෙහි ඇතුළත් ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල වන රු. ................................ක මුදල ඉල්ලුම්කරු විසින් ආපසු ඉල්ලා සිටි විටක දී තැන්පත් ගිණුමෙන් ආපසු ගෙවීම පිණිස;
- 20................................ දින නිකුත් කළ ඉහත සඳහන් අංක ........................................... දරන ලදුපතෙහි ඇතුලත් ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදලෙන් අය කර ගත යුතු අලාභය සහ / හෝ ප්‍රමාද ගාස්තු වශයෙන් වූ රු. ................................ක මුදල අඩු කර ගෙන 6 – 52 (ii) ආදායම් ශීර්ෂයට බැර කොට ඉතිරි මුදල වන රු. ................................ක මුදල ඉල්ලුම්කරු විසින් ආපසු ඉල්ලා සිටි විටක දී තැන්පත් ගිණුමෙන් ආපසු ගෙවීම පිණිස;
- 20................................ දින නිකුත් කළ ඉහත සඳහන් අංක ........................................... දරන ලදුපතෙහි ඇතුලත් ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල, අය කර ගත යුතු අලාභ සහ හෝ ප්‍රමාද ගාස්තු වශයෙන් වූ රු. ................................ක මුදල වශයෙන් හිලව් කර ගෙන 6 – 52 (ii) ආදායම් ශීර්ෂයට බැර කිරීමටත් තව දුරටත් අය විය යුතු මුදල වන රු. ................................ක මුදල සභාවට ගෙවන ලෙස ඉල්ලුම්කරු දැනුවත් කිරීමටත්, එසේ අය කර ගන්නා මුදල ද ඉහත ආදායම් ශීර්ෂයට බැර කිරීමටත්;

යොමු කරමි.

දිනය : 20................................ ....................................

පෙරටු කාර්යාල නිලධාරී / විෂය භාර නිලධාරී

---

**<u>ක්‍රීඩා පිට්ටනිය කුලියට ලබා දීමේ කොන්දේසි</u>**

1. සභාව සතුව ඇති කුලියට දිය හැකි ක්‍රීඩා පිට්ටනිය ලබා දීම ඒ සඳහා වන ඉල්ලුම් පත්‍ර ලැබෙන අනුපිළිවෙළ අනුව පමණක් සිදු කරනු ලැබේ. කිසිඳු අවස්ථාවක, ඒ අනුපිළිවෙළ වෙසන් කිරීමක් කරනු නොලැබේ.

2. (අ) ක්‍රීඩා පිට්ටනිය කුලියට දීමේදී අය කරනු ලබන දෛනික ගාස්තුව සහ එක් එක් වර්ගයේ සේවා සඳහා අය කරනු ලබන ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල් පහත පරිදි වේ. ක්‍රීඩා පිට්ටනිය කුලියට ලබා ගැනීමට පෙර ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදල් ප්‍රමාණය සහ කුලී මුදල් ප්‍රමාණය කලින් ගෙවා ක්‍රීඩා පිට්ටනිය වෙන් කරවා ගත යුතුය.

   (ආ) ක්‍රීඩා පිට්ටනිය ආපසු භාර දීමට නියමිත වේලාව පසු වුවහොත් එසේ පසුවන එක් එක් පැයක කාලය වෙනුවෙන් රුපියල් ....................................ක ප්‍රමාද ගාස්තුවක් අය කරනු ලැබේ. මෙසේ

අමතර කාලයක් සඳහා ඉඩ ලබාදීම සිදුවන්නේ එම කාලය තුළ වෙනත් වෙන්කිරීමක් සිදුකර නොමැති නම් පමණි.

(ඈ) ක්‍රීඩා පිට්ටනියට හෝ එහි කිසියම් කොටසකට හෝ කිසියම් උපකරණයකට හෝ හානියක් හෝ අලාභයක් සිදු වී නොමැති නම්, ක්‍රීඩා පිට්ටනිය ආපසු සභාවට නිදහස් කර දීමෙන් පසුව, සේවාව ලබාගත් දින සිට ලිත් වර්ෂයක් ගත වීමට පෙර ආපසු ඉල්ලා සිටි අවස්ථාවේ දී ඉල්ලුම්කරුට ඒ මුදල ගෙවනු ඇත.

(ඇ) ඉහත පරිදි කිසියම් හානියක් හෝ අලාභයක් සිදු වී ඇත්නම්, ඒ හානියේ හෝ අලාභයේ ප්‍රමාණය පියවා ගැනීම වෙනුවෙන් ගණන් බලනු ලබන මුදලක් ඉල්ලුම්කරු විසින් තැන්පත් කරනු ලැබූ ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදලෙන් අඩු කර ගන්නා අතර ඉන් යම් ඉතිරියක් වේ නම්, ක්‍රීඩා පිට්ටනිය නිදහස් කර දීමෙන් පසුව, සේවාව ලබා ගත් දින සිට ලිත් වර්ෂයක් ගත වීමට පෙර ආපසු ඉල්ලා සිටි අවස්ථාවේදී ඉල්ලුම්කරුට ඒ මුදල ගෙවනු ඇත.

(ඉ) ඉහත පරිදි කිසියම් හානියක් හෝ අලාභයක් සිදු වී ඇත්නම්, ඒ හානියේ හෝ අලාභයේ ප්‍රමාණය පියවා ගැනීම වෙනුවෙන් ගණන් බලනු ලබන මුදල, ඉල්ලුම්කරු විසින් තැන්පත් කරනු ලැබූ ආපසු ගෙවනු ලැබිය හැකි තැන්පත් මුදලට වඩා වැඩි වන්නේ නම්, එසේ වැඩි වන මුදල ඉල්ලුම්කරු විසින් සභාවට ගෙවිය යුතුය. තවද එසේ වැඩි වන මුදල සභාවට ගෙවීමට ඉල්ලුම්කරු අපොහොසත් වන්නේ නම්, ඒ මුදල අය කර ගැනීමට ඉල්ලුම්කරුට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට සිදු වන බවත්, එසේ ඉල්ලුම්කරු ඊට යටත් වන බව ඉහත ඉල්ලුම්පත්‍රයට අත්සන් තැබීමෙන්ම ඉල්ලුම්කරු විසින් පිළිගෙන ඇති බවට සලකනු ලැබේ.

3. ඉල්ලුම්කරුගේ ඉල්ලීම ඉටු කළ යුතු දිනය වෙනුවෙන් වෙනත් ඉල්ලුම්කරුවෙකු විසින් සේවාව වෙන් කර ගෙන ඇත්නම් පසුව කෙරෙන ඉල්ලුම්කරුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. කිසියම් නොවැළැක්විය හැකි හේතුවක් නිසා ඉල්ලුම්කරුගේ ඉල්ලීම ඉටු කිරීමට සභවට නොහැකි වුවහොත් විකල්ප ක්‍රියාමාර්ගයක් ගැනීමට ක්‍රියාකරනු ලබන අතර, එසේ කිරීමට ද නොහැකි වුවහොත් අය කළ මුදල ආපසු ගෙවනු ලබන අතර, ඊට අතිරේකව කිසිඳු වන්දියක් හෝ අලාභයක් ගෙවීමට ප්‍රාදේශීය සභාව බැඳී නැත.

5. පූර්ව සූදානම් වීමේ කාලය අතරතුර හෝ කාර්යය පැවැත්වෙන අතරතුර දී විදුලි බලය විසන්ධි වීම වැනි ප්‍රාදේශීය සභාවට පාලනය කළ නොහැකි වෙනත් යම් හේතුවක් මත සිදුවන අපහසුතා පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකීමට බැඳී නැත.

6. ඉල්ලුම්කරු විසින් ක්‍රීඩා පිට්ටනිය කලින් වෙන් කරවාගෙන තිබිය දී යම් පසු අවස්ථාවක, වෙන් කරවා ගැනීම අවලංගු කිරීමට ඔහු ක්‍රියා කරනු ලබන්නේ නම් ඒ සඳහා පරිපාලන ගාස්තු වශයෙන් රුපියල් ..................................... මුදලක් අඩු කරගනු ලැබේ.

7. කසල වෙන් කර දැමිය යුතුය. කසල වෙන් කර දමා නොදමන්නේ නම් ඇප මුදල ආපසු ලබා දෙනු නොලැබේ.